# මේසය හා මනස

මනස පිළිබඳ අපි බොහෝ දේ කතා කර ඇත්තෙමු. එහෙත් මනස යනු කුමක් දැයි අපි නො දන්නෙමු. මෙහි දී යමකු නැති මනසක් ගැන දැනගන්නේ කෙසේ ද යන ප්‍රශ්නය අසනු ඇත. අපි පළමුවෙන් ම ඒ ප්‍රශ්නයට පිළිතුරක් ලබාගනිමු. සංකල්ප ඉතා වැඩි ප්‍රමාණයක් භාෂාත්මක වේවා, චිත්ත රූප වේවා පෘථග්ජන සත්ත්වයන්ගේ නිර්මාණ වෙයි. ඒ සංකල්ප අනිත්‍ය දුක්ඛ අනාත්ම අනවබෝධයෙන් නිර්මාණය කෙරෙන දෑ වෙයි. බුදුන්වහන්සේ ද රහතන් වහන්සේලා ද ඇතැම් විට සංකල්ප නිර්මාණය කර ඇත. අප කලින් සඳහන් කර ඇති පරිදි පටිච්ච සමුප්පාදය වැනි දෑ බුදුන් වහන්සේ විසින් නිර්මාණය කරණ ලද සංකල්ප වෙයි. එහෙත් ඒ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, අනවබෝධය නිසා නිර්මාණය කෙරුණු සංකල්ප නො ව පෘථග්ජන සත්ත්වයනට කරුණු තේරුම් කර දීම පිණිස නිර්මාණය කෙරුණු සංකල්ප වෙයි.

බුදුන්වහන්සේ ද රහතන් වහන්සේලා ද පිරිනිවන්පාන තෙක් මනසක් සහිතව වැඩ විසූ හ. මනස ද අනෙක් ඉන්ද්‍රියන් මෙන් ම පිරිනිවන්පාන තෙක් තම කාර්යභාරයෙහි යෙදෙයි. රහතන් වහන්සේ නමකගේ ඇස් පෙනීම, කන් ඇසීම ආදිය සෝපාදිශේෂ නිවන් අවබෝධයත් සමග අක්‍රියාත්මක නොවන්නේ යම් සේ ද, මනස ද අක්‍රියාත්මක නො වෙයි. මනසේ කාර්යභාරය එක් පැත්තකින් අනෙක් ඉන්ද්‍රිය සමග එකතු වී විකද්කදාණය ඇති කිරම ය. චක්ඛු විකද්කදාණය ආදිය ඇතිවන්නේ මනස එලෙස ඇස සමග එකතු වීමෙන් ය.

අනෙක් අතට මනසට වෙනත් ඉන්ද්‍රියක් සමග එකතු නො වී ද කටයුතු කළ හැකි ය. මනසට වෙනත් ඉන්ද්‍රියක සහායක් නොමැතිව ද සංකල්ප නිර්මාණය කළ හැකි ය. මනසෙහි මේ ද්විත්ව ක්‍රියාකාරත්වය අප තේරුම් ගත යුතු ය. මෙවැනි මනසක් පාථග්ජන සත්ත්වයන් විසින් නිර්මාණය කෙර ඇත. ඒ මනස සෝපාදිශේෂ නිවන් අවබෝධයෙන් පසුව ද ඇත්තේ ඒ එසේ නො වන බව පිළිබඳ "හැඟීමක්" ඇති කරමින් ය. මෙහි හැඟීම යන වචනය පාවිච්චි කෙර ඇත්තේ එයට වඩා සුදුසු වචනයක් සිතා ගැනීමට නොහැකි බැවින් මිස එලෙස හැඟීමක් ඇතිවන නිසා නො වෙයි.

ගිනි බෝලයක් කැරකැවීමේ දී ගිනි වළල්ලක් මෙන් පෙනී ගිය ද, එහි ගිනි වළල්ලක් නොමැති බව වැඩිහිටියෙක් දනියි. මනසක් ඇති බව දැනුණ ද, ඒ නැති මනසක් බව සෝපාදිශේෂ නිවන් අවබෝධයෙන් පසු හැඟෙනු විය යුතු ය. එහෙත් ඒ හැඟීම කුමක් දැයි විස්තර කිරමට අපි අපොහොසත් වෙමු. මේ වචනවල සීමාවක් වෙයි. එහෙත් ඒ සංගීතයෙහි පටන්ගැන්මක් ද නො වෙයි. සංගීත ඛණ්ඩයකින් හෝ මට අවශ්‍ය දේ ප්‍රකාශ කළ නොහැකි ය. ඒ පිළිබඳ සංකල්ප, සංගීත ඛණ්ඩ, චිත්ත රූප ආදී කිසිවක් නිර්මාණය කිරමට අපි අපොහොසක් වෙමු. එබැවින් අපි එයට "හැඟීමක්" යැයි කොටු කොමා සහිත ව ප්‍රකාශ කරමු.

කෙසේ වෙතත් පෘථග්ජනයන්ගේ මනස පවතියි. නැති මනසක් එලෙස ඇති මනසක් බවට පත්වන්නේ කෙසේ ද? අප කලින් සඳහන් කර ඇති කරුණු අනුව අනෙක් සියල්ල මෙන් ම මනස ද මනසෙහි ම නිර්මාණයක් වෙයි. මනසෙහි නිර්මාණයක් වූ මේසය පිළිබඳ අපට බොහෝ දේ කිව හැකි ය. මේසය ද ඒ සියල්ල ද සම්මුතීන් ය. සම්මුතියක් වූ මේසය පිළිබඳව සම්මුතීන් වූ ලී, ලෑල්ල, වඩු බාසුන්නැහැ ආදී සම්මුතීන් ආශ්‍රයෙන් අපි ප්‍රකාශ කරමු. එහි ගැටලුවක් නැත. ඒ සෑම අවස්ථාවක දී ම අප කතා කරන්නේ සම්මුතීන් ගැන පමණක් බව අප මතක තබාගත යුතු ය.

මේසය ආදිය වාස්තවික ව, එසේත් නැත්නම් යථාර්ථවාදීව නැත. වාස්තවික මේසයක් නො පවතියි. මේසය යන සංකල්පය අපේ නිර්මාණයක් පමණකි. ඒ පවතින්නේ සම්මුතියක් ලෙස පමණකි. හුදු පැවැත්ම යැයි අප කියන සෑම දෙයක් ම සම්මුතීන් වෙයි. ඒ අරුතින් ගත් කල අප කතා කරන්නේ නැති මේසයක් ගැන ය. එහෙත් නැති මේසයක් ගැන කතා කිරමට, මේසයක් ඇතැයි සම්මුතියෙන් ගෙන කතා කිරමට අපට බාධාවක් නැත. එමෙන් ම මේසය පිළිබඳ අවශ්‍ය නම් ප්‍රවාද සකස් කළ හැකි ය.

නැති මේසයක් ගැන එලෙස සම්මුතියෙන් කතා කරන්නාක් මෙන් ම නැති මනසක් ගැන ද කතා කළ හැකි ය. එනම් නැති මනස ඇතැයි සම්මුතියෙන් ගෙන කතා කළ හැකි ය. අවශ්‍ය නම් මනස ගැන ප්‍රවාද නිර්මාණය කළ හැකි ය.

© Prof. Nalin De Silva

එහි කිසිදු ගැටලුවක් නැත. මනස ගැන බටහිර නිර්මාණය කෙර ඇති ප්‍රවාද අප තේරුම් ගත යුත්තේ එලෙස සම්මුතියෙන් පවතින මනසක් පිළිබඳ ව වෙනත් සංකල්ප හා ප්‍රවාද ආශ්‍රයෙන් ගොඩනැගී ඇති දෑ ලෙස ය.

මෙහි දී අපට ඇති ගැටලුව මනස පිළිබඳ සංකල්පය අනෙක් සංකල්පවලට වඩා දරන විශේෂත්වය ය. අනෙක් සෑම සංකල්පයක් ම ද මනසේ නිර්මාණ වුවත් ඒ සංකල්ප මනස නො වෙයි. එබැවින් අනෙක් සංකල්ප ද නැති වුවත්, සංකල්ප ලෙස ගත් කල ශූන්‍ය වුවත්, අප ඒ සංකල්ප මනසින් බැහැරව පවතින්නේ යැයි ගන්නා බැවින් ඒ පිළිබඳ ප්‍රවාද නිර්මාණය කිරමේ දී අපට ගැටලු පැන නො ගනී. මේ ගැටලු මානසික බව ද අමුතුවෙන් කිව යුතු නැත. එහෙත් මනස සම්බන්ධයෙන් මේ මානසික ගැටලුව තීව්‍ර වෙයි. නැති මනසක් ඇතැයි ගැනීමත් ඒ සංකල්පීය මනස පිළිබඳ ප්‍රවාද නිර්මාණය කිරමත් සිදු කෙරෙන්නේ ද මනස විසිනිි

බටහිර මනස පිළිබඳ ගොඩනැගී ඇති ප්‍රවාද රාශියක් වෙයි. මනස ගැන කතා කිරමේ දී අපට බටහිර මනෝ විද්‍යාව (Psycology)-, මනෝ චිකිත්සාව (Psychiatry)-, මෙන් ම මනෝ විශ්ලේෂණය (Psychoanalysis)- ද හමුවෙයි. මේ එක එකින් කියැවෙන්නේ එකක් ම නො වෙයි. සාමාන්‍යයෙන් බටහිර වෛද්‍ය විද්‍යාව ඉගැන්වෙන පීඨවල ඉගැන්වෙන්නේ මනෝ චිකිත්සාව ය. මනෝ විද්‍යාව යනුවෙන් හැඳින්වෙන දැනුම් බටහිර දැනුම ලබා දෙන විශ්වවිද්‍යාලවල බොහෝ විට ඉගැන්වෙන්නේ දර්ශනය පිළිබඳ අධ්‍යයනාංශවල ය. මනෝ විශ්ලේෂණය යනුවෙන් හැඳින්වෙන දැනුම් පද්ධතියෙහි නිර්මාතෘවරයා ලෙස සැලකෙන්නේ සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් විද්වතාණන් ය.

ෆ්‍රොයිඩ් විද්වතා අනුව ගිය අය අතර ඔහුගේ සිසුවකු වූ කාල් යුං පඬිවරයා ද පසුකලෙක වූ යැක් ලැකාන් විද්වතා ද වෙති. ඒ අය ෆ්‍රොයිඩ් විද්වතාණන්ගේ මත සමග සම්පූර්ණයෙන් එකඟවන බවක් මෙයින් නො කියැවෙයි. අද මෙරට සිටින පශ්චාත්නූතනවාදීන් යැයි බෙරිහන් දී ගන්නවුන් මෙන් ම පශ්චාත්ව්‍යුහවාදීන් යැයි මොර දෙන්නවුන් ද බොහෝ විට ලැකාන් විද්වතාගේ මතිමතාන්තර අනුකරණය කරනු දක්නට හැකි ය. ඔවුන් කතා කරන්නේ මනෝ චිකිත්සාවක් හෝ මනෝ විද්‍යාවක් හෝ ගැන නො ව මනෝ විශ්ලේෂණයක් ගැන ය.

අප මෙහි දී සඳහන් කළ යුතු ප්‍රධාන ම කරුණ නම් මනෝ විශ්ලේෂණය බටහිර විද්‍යාවේ කොටසක් ලෙස භාර නොගනීම ය. ෆ්‍රොයිඩ් හෝ ලැකාන් හෝ වෙනත් මනෝ විශ්ලේෂකයකු ඉදිරිපත් කරන අදහස් පරීක්ෂාවට ලක් නො කෙරෙන බව බටහිර විද්‍යාඥයන්ගේ විශේෂයෙන් ම බටහිර විද්‍යාව පිළිබඳ දාර්ශනිකයන්ගේ අදහස ය. කාල් පොපර් නම් බටහිර විද්‍යාව පිළිබඳ දාර්ශනිකයා මේ සම්බන්ධයෙන් අදහස් දක්වා ඇත. අප කලින් සඳහන් කර ඇති මේ දාර්ශනිකයාට අනුව බටහිර විද්‍යාවේ ඇති ප්‍රධාන ම ලක්ෂණය නම් එහි ප්‍රවාද අසත්‍යකරණයට ලක් කිරමට ඇති හැකියාව ය. අසත්‍යකරණයට ලක් කළ නොහැකි දැනුමක් බටහිර විද්‍යාවට අයත් ලෙස ඔහු නො සලකයි.

පොපර් පඬිවරයා පෙන්වා දෙන්නේ මනෝ විශ්ලේෂණය යැයි හැඳින්වෙන දැනුම් පද්ධතියෙහි ප්‍රවාද අසත්‍යකරණයට ලක් කළ නොහැකි බව ය. මාක්ස්වාදය හා ජ්‍යොතිෂය ද එසේ අසත්‍යකරණයට ලක් කළ නොහැකි දැනුම් පද්ධති දෙකක් බව ඔහු පෙන්වා දෙයි. මනෝවිශ්ලේෂණය ද, මාක්ස්වාදය හා ජ්‍යොතිෂය මෙන් ම බටහිර විද්‍යාවන් නො වේ ය යනු පොපර් පඬිවරයාගේ මතය වෙයි. පෙරදිග ජ්‍යොතිෂයට මෙය ගැටලුවක් නො වෙයි. එයට හේතුව එය බටහිර විද්‍යාවක් යැයි කීමට හරිහමන් පෙරදිග ජ්‍යොතිශ්ශාස්ත්‍රඥයකුට අවශ්‍ය නොවීම ය. එහෙත් බටහිර විද්‍යාවන් යැයි කියාගැනීමට උත්සාහ දරන මාක්ස්වාදයට හා මනෝ විශ්ලේෂණයට ඒ ප්‍රශ්නයක් වීම නොවැළැක්විය හැකි ය.

පොපර් පඬිවරයාගේ නිර්ණායක අපට වැදගත් නැති බව කලින් සඳහන් කර ඇත. එයට හේතුව එහි ඇති ඇතැම් පරප්සර ය. අසත්‍යකරණයට ලක් කෙරෙන්නේ ප්‍රවාදයක කිනම් කොටසක් ද යන්නෙහි සිට අසත්‍යකරණ ප්‍රවාදය සම්බන්ධයෙන් අපට ප්‍රශ්න වෙයි. එහෙත් පොපර් පඬිවරයාගේ මතවාද පිළිගන්නා අයට අසත්‍යකරණයට ලක් නොවීම ගැටලුවක් වෙයි. ඒ අය මාක්ස්වාදය හෝ මනෝ විශ්ලේෂණය හෝ බටහිර විද්‍යාවක් යැයි කීම

© Prof. Nalin De Silva

රැවුලත්, කැඳත් දෙක ම බේරාගැනීමට කරන උත්සාහයක් පමණක් වෙයි. සමස්තයක් ලෙස ගත හොත් මාක්ස්වාදයෙහි සමාජ විකාශය ආර්ථිකයට ඌනනය කිරමට උත්සාහ ගැනෙන අතර මනෝවිශ්ලේෂණයෙහි මනෝභාවයන් ලිංගිකත්වයට ඌනනය කිරමට උත්සාහ ගැනෙයි.

බටහිර විද්‍යාවෙහි අඩංගු ඌනිතවාදය ඒ දනුම් පද්ධති දෙකෙහි ම ඇති බව පැහැදිලි ය. එහෙත් ඌනිතවාදය ම වුව ද ප්‍රශ්න කිරම්වලට ලක් වෙයි. කලින් සඳහන් කර ඇති පරිදි ගණිතයෙහි දක්නට ලැබෙන ගර්ඩල් ප්‍රමේයට (Godel Theorem)- අනුව ඌනිතවාදයෙහි ගැටලු ඇති බව පැහැදිලි ය. එහෙත් ගර්ඩල් ප්‍රමේයට අනුව ඌනිතවාදය අසත්‍ය යැයි තවමත් කිසිවකු විසින් හෝ පෙන්වා දී නොමැත. අප ඒ බව සඳහන් කරන්නේ ප්‍රවාදයට අනුව එසේ ඌනිතවාදයෙහි ගැටලු ඇති බව හා ප්‍රවාදයෙන් ඌනිතවාදය අසත්‍යවන්නේ යැයි කීම එකක් නො ව දෙකක් බව පැහැදිලි කිරම සඳහා ය. හැකිතාක් නිරවුල් ව සංගත ව කල්පනා කිරමට අප උත්සාහගත යුතු ය.

මේ අතර අප සියල්ලන්ට සතුටුදායක පුවතක් සඳහන් කළ යුතු වෙයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි වෛද්‍ය පීඨයෙහි ශිෂ්‍යයෙක් මනස පිළිබඳ අපේ ප්‍රවාදයක්, එනම් අපේ සංස්කෘතියෙහි නිර්මාණය වන ප්‍රවාදයක් ගැන කටයුතු කරමින් සිටියි. අභිධර්මය ආශ්‍රිත ව ඒ ප්‍රවාදය ගොඩනැගීම ඔහුගේ බලාපොරොත්තුව වෙයි. අප සිතන අයුරින් බුද්ධිමතකු වනුයේ බොහෝ කරුණු දැනගත් අයකු නො ව තම සංස්කෘතියෙහි අවිඥනිකව ඇති දෑ සවිඥානික ව නිර්මාණාත්මක ව පෙන්වා දෙන තැනැත්තකු ය. මේ ලිපි පෙළ ලිවීමේ එක් අරමුණක් වනුයේ ද එවැනි ජාතික බුද්ධිමතුන් පිරිසක් බිහි කර ගැනීම ය. අපට අවශ්‍ය වන්නේ අභිධර්මයෙහි හෝ බෞද්ධ සාහිත්‍යයෙහි වෙනත් තැනක හෝ ඇති දෙයක් ඒ අයුරින් ම කිව හැකි කෙනකුට වඩා ඒ කරුණු ආශ්‍රයෙන් අලුත් දෙයක් නිර්මාණය කරගත හැකි අයකු ය. අභිධර්මයෙහි සඳහන් ව ඇති කරුණු ආශ්‍රයෙන් මනස පිළිබඳ ප්‍රවාදයක් ගොඩනගා ගැනීමට හැකි නම් සැබවින් ම එය රටට ඉතා වැඩදායක වනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva